උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක: 26/2017 (I)

මගේ අංකය -: NP/07/10/04/34
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
2017.12.04

**ප්‍රධාන ලේකම්,**
ආණ්ඩුකාර ලේකම්,
අමාත්‍යංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
**උතුරු පළාත.**

## කුසලතා පදනම මත පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරඟ විභාගය- 2017

උක්ත විභාගයට අදාල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 26/2017හි 3 ඡේදයේ පළමු වගන්තිය 6 (ඉ) ඡේදයෙහි අයදුම්පත් කැඳවන අවසාන දිනය සහ 7 (ඉ) ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

I. **3 ඡේදයෙහි පළමු වගන්තිය පමණක් පහත පරිදි සංශෝධනය වේ.**

අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් කුසලතා පදනම මත සිදු කරනු ලබන අතර ඒ අනුව පුරවනු ලබන පුරප්පාඩු ගණන 18 කි.

II. 6(ඉ) ඡේදයෙහි අයදුම්පත් කැඳවන අවසන් දින **2017.12.31** දක්වා දීර්ඝ කරනු ලැබේ. ඒ අනුව, අයදුම්කරුවන් 2017.12.31 දින වන විට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

III. **7 (ඉ) ඡේදය පහත පරිදි සංශෝධනය වේ.**

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයෙහි පිටපතද, විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාල ලදුපතෙහි පිටපතද අතැතිව, විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

IV. මෙම විභාගය සඳහා මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවීමෙන් වළකින ලෙස දැනුම් දෙනු ලැබේ.

**සී.ඒ.මෝහන්රාස්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.